# කුඩා රටක කුරු උගත්තු

අපට සංගීතයක්, විද්‍යාවක්, වෙදකමක් ආදී වශයෙන් ගතහැකි කිසිවක් තිබී නැත යනුවෙන් සිතීමට අප පුරුදු කර තිබීමේ ප්‍රතිඵලය වුයේ දහනවවැනි සියවස අග හා විසිවැනි සියවස මුල සංගීතය හා වෙදකම හැදෑරීම සඳහා දක්ෂ තරුණයන් ඉන්දියාවට, එනම් බ්‍රිතානීන් විසින් නිර්මාණය කරනු ලැබූ ඉන්දියාවට, පිටත්කර හැරීම ය. විද්‍යාව ගණිතය හා ශාස්ත්‍ර හැදෑරීම සඳහා සිසුහු එංගලන්තයට ගියහ. ඒ අතර සංස්කෘත පාලි ආදී භාෂා හැදෑරීම සඳහා ද සිසුන් ඇතුල්වුයේ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ එවකට තිබූ ප්‍රාචීන අධ්‍යයන ආයතනයට ය. ඒ වන විට බ්‍රිතානීන් විසින් ලන්ඩන් විශ්වවිද්‍යාලය එවැනි අධ්‍යයනයන්හි ද ප්‍රමුඛස්ථානයට නිල වශයෙන් පත්කරගෙන තිබුණි.

පාලි  බෞද්ධ හා සිංහල අධ්‍යයන සම්බන්ධයෙන් දහනවවැනි සියවසේ අගභාගයේ දී ලෝකයේ ප්‍රමුඛ ම විශ්වවිද්‍යාල දෙක වුයේ විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් ය. එහෙත් ඒ ආයතන පිරිවෙන් ලෙස මිස විශ්වවිද්‍යාල වශයෙන් සලකුණු නො ලැබිණි. එහි අධ්‍යාපන මාධ්‍යය වුයේ ද සිංහල ය. එකල ද ඉංග්‍රීසියෙන් ලැබෙන අධ්‍යාපනය උසස්කොට සැලකීමට අපට පුරුදුකර තිබුණි. විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් ඊනියා විශ්වවිද්‍යාල නොවීම නිසා විශේෂයෙන් ම ශිෂ්‍යත්වලාභී ගිහි සිසුහු සිංහල, පාලි බෞද්ධ ධර්මය ඉගෙනීම සඳහා ද ලන්ඩන් විශ්වවිද්‍යාලයට යෑමට පුරුදුව සිටියහ.

එදා තිබූ විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන්වලට පසු කලෙක ඊනියා විශ්වවිද්‍යාල තත්වය පිරිනැමිණි. එහෙත් එදා අවුරුදු පනහකට පෙර සිදුවුයේ ඒ ආයතනවලට විශ්වවිද්‍යාල තත්වය පිරිනැමීම නො වේ. ඒ ආයතනවල තත්වය එහි උගන්වන ලද කරුණු සම්බන්ධයෙන් ගත්කල එදා ලන්ඩන් විශ්වවිද්‍යාලයේ තත්වයට වඩා උසස් විය. අවුරුදු පනහකට පෙර සිදුවුයේ ඒ ආයතන දෙකට බටහිර විශ්වවිද්‍යාල ආකෘතිය ලබාදීම ය.

අපට වැවයි දාගැබයි හැරෙන්නට වෙනත් කිසිවක් නැතැයි සිතන්නට අප පුරුදු කෙරී තිබුණි. වැවයි දාගැබයි වුව ද අතීතයට මිස වර්තමානයට හෝ අනාගතයට හෝ අයත් නොවන්නක් ය යන අදහස ද අපේ සිත්වලට ඇතුල්කෙරී තිබුණි. අප රට කුඩා රටක් ය යන අදහස ද සිතියම් මාර්ගයෙන් අපේ සිත්වලට කාන්දුකර තිබුණි. අප රට එංගලන්තයට වඩා එතරම් කුඩා නැතිවුවත් කඩදාසියක අඳින ලද සිතියමෙහි ලංකාව එංගලන්තයට වඩා කුඩා විය.

එයට හේතුව වුයේ කඩදාසියක අඳින සිතියම යනු ලෝක ගෝලය තලයක් මත ප්‍රක්ෂේපණය කිරීමකින් ලැබෙන්නක් වීම ය. උත්තර ධ්‍රැවය මූලය ලෙස ගෙන ලෝක ගෝලය තලයක් (උදාහරණයක් ලෙස කඩදාසියක්) මත ප්‍රක්ෂේපණය කිරීමේ ප්‍රතිඵලය වනුයේ නිරක්ෂයට ආසන්න භූමි තලයෙහි කුඩාවට පෙන්නුම් කිරීමත් ධ්‍රැවවලට සමීප රටවල් විශාලව පෙන්නුම් කිරීමත් ය. මෙලෙස ගෝලයක එක් ලක්ෂයක් මූල ලක්ෂය ලෙස ගෙන ගෝලය තලයක් මත ප්‍රක්ෂේපණය කිරීමට මර්කේටර ප්‍රක්ෂේපණය යැයි කියනු ලැබෙයි. මර්කේටර යනු දහසයවැනි සියවසේ දී මේ ප්‍රක්ෂේපණ ක්‍රමය පළමුවෙන් යොදාගත් තැනැත්තා යැයි කියනු ලැබයි.

තලයක (කඩදාසියක) එලෙස මර්කේටර ප්‍රක්ෂේපණය ඔස්සේ අඳින ලද සිතියම් මගින් ද නිරක්ෂය අසල ඝර්ම කලාපීය රටවල ජනතාවගේ මානසිකත්වය කඩාබිඳ දමනු ලැබිණි. විශේෂයෙන් ම ලංකාවට මේ ප්‍රශ්ණය වැදගත් විය. අප රට ඉන්දියාව මෙන් අක්ෂාංශක කිහිපයක් පුරා පැතිරී නො යයි. එංගලන්තය ද එසේ අක්ෂාංශක කිහිපයක් පුරා පැතිර නොයයි. එහෙත් එංගලන්තය උත්තර ධ්‍රැවයට සමීප බැවින් එරට ලංකාවට වඩා සිතියමෙහි විශාලව පෙනෙයි. සමස්තයක් ලෙස ගත්කල යුරෝපීය රටවල් උත්තරධ්‍රැවයට සමීප ව ද ආසියාතික හා අප්‍රිකානු රටවල් උත්තරධ්‍රැවයෙන් ඈත්ව නිරක්ෂය සමීපයෙහි ද පිහිටයි. එහි ප්‍රතිඵලය වුයේ ලෝක සිතියමෙහි යටත්විජිතවාදී රටවල් විශාලව ද යටත්විජිත කුඩාවට ද පෙනීම ය.

සිතියමෙහි කුඩා හෝ විශාලව පෙනීම හා රටවලට ඇති වැදගත්කම අතර සම්බන්ධයක් වෙයි. ටොලමිගේ සිතියමෙහි ලංකාව දක්වා ඇත්තේ ප්‍රමාණයට වඩා විශාලව පෙනෙන ආකාරයට ය. එකල ලෝකයෙහි ලංකාවට තිබූ වැදගත්කම සිතියමෙහි එලෙස දැක්වීමට එක් හේතුවක් විය. විලෝම ව සිතියමෙහි කුඩාව හෝ විශාලව දැක්වීම මගින් රටකට

© Prof. Nalin De Silva

ලැබෙන වැදගත්කම ද අඩුවැඩි කළ හැකි ය. යුරෝපීයයකු වූ මර්කේටර්ගේ ප්‍රක්ෂේපණය ආධාරයෙන් යටත්විජිතවාදී රටවලට වැඩි වටිනාකමක් හා යටත්විජිතවලට අඩු වටිනාකමක් දීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට හැකිවිය. මර්කේටර් ප්‍රක්ෂේපණය හුදු ප්‍රක්ෂේපණයක් පමණක් නො වී ය. එහි දේශපාලන හා සංස්කෘතික වැදගත්කමක් ද විය.

කලින් සඳහන් කර ඇති පරිදි සංගීතය හා වෙදකම ඉගෙනීම සඳහා ඉන්දියාවට ද අනෙක් විෂය ඉගෙනීම සඳහා එංගලන්තයට ද යෑමෙන් බොහෝ විට අපේ උගතුන්ට ලැබුණේ දීනකමකි. ඉන්දියාවට ගොස් වෙදකම හෝ සංගීතය හෝ ඉගෙන පැමිණි බොහෝ දෙනා චින්තනයෙන් ඉන්දියානු වීමට උත්සාහ කළහ. ඇතැම්විට ඔවුන්ගේ ඇඳුම් පැලඳුම්වල ද ආහාරපානවල ද ජීවන රටාවෙහි ද ඉන්දීය ලක්ෂණ දැකගත හැකි විය. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් සිංහල සංගීතයක් ඇතැයි පිළිගැනීමට නොව එසේ සංගීතයක් තිබිණි දැයි සොයා බැලීමට වුවද විරුද්ධ වූහ. අනෙක් අතට ඉන්දියාවේ ආයුර්වේදය හදාරා පැමිණි වෙදමහත්වරු පාරම්පරික වශයෙන් ඉතිරි වී තිබුණු සිංහල වෙදකම ශාස්ත්‍රීය යැයි පිළිගැනීමට අකමැති වූහ.

පණ්ඩිත වික්‍රමාරච්චි මහතා ආයුර්වේදය ලංකාවේ දී ඉගැන්වීම සඳහා ආයතනයක් ආරම්භ කෙළේ ය. එය පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් විය. එකල නිදහස් අධ්‍යාපනය නොතිබූ බැවින් දෝ මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිහිටුවීමට කිසිවෙක් විරුද්ධ නොවූහ. අනෙක් අතට අද ද බටහිර නොවන වෙදකම උගන්වන පෞද්ගලික ආයතන කිහිපයක් තිබෙන නමුත් ඒ ආයතන කිසිම විරුද්ධතාවකින් තොරව පවත්වාගෙන යනු ලැබෙයි. පෞද්ගලික වෛද්‍ය විද්‍යා අධ්‍යාපන ආයතනවලට පොදුවේ ගත්කල විරුද්ධතාවක් නැති බව ඉන් පෙනී යයි. විරුද්ධතාව ඇතිවන්නේ බටහිර වෙදකම වෘත්තීය මට්ටමට ඉගැන්වීම සඳහා පෞද්ගලික ආයතන පිහිටුවීමට තැත්කරන විට ය.

එක් පැත්තකින් බටහිර නොවන වෙදකම පෞද්ගලික ආයතනවල ඉගැන්වෙයි. අනෙක් පැත්තෙන් වෙදකම හැරෙන්නට වෙනත් ශිල්ප ශාස්ත්‍ර උපාධි හෝ වෘත්තීය හෝ මට්ටමට ඉගැන්වෙන පෞද්ගලික ආයතන වෙයි. විරුද්ධතාව ඇත්තේ ඊනියා උපාධි කඩවලට නොවන බව පැහැදිලි ය. විරුද්ධතාව ඇත්තේ බටහිර වෙදකම පෞද්ගලිකව උපාධි (වෘත්තීය) මට්ටමට ඉගැන්වීමට ය. මෙහි ඇත්තේ ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් නොවන බව පැහැදිලි ය. ප්‍රතිපත්තියක් මත විරුද්ධවන්නේ නම් සියළුම ක්ෂේත්‍රවල උපාධි (වෘත්තීය) මට්ටමට ඉගැන්වෙන පෞද්ගලික ආයතනවලට විරුද්ධ විය යුතු ය. මෙය රැකියාව හා වැදගත්කම පිළිබඳ ප්‍රශ්නයකි.

මෙරට වැදගත්කමක් හා තරමක වැටුපක් ලැබෙන රැකියා ඇති එක් ක්ෂේත්‍රයක් නම් බටහිර වෛද්‍ය වෘත්තිය ය. ඒ ක්ෂේත්‍රයෙහි අධ්‍යාපනය පිළිබඳ ඒකාධිකාරය තවමත් රජය සතුවෙයි. පරිගණක විද්‍යාව, නීතිය, කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල රජයට එවැනි ඒකාධිකාරයක් නැතිවා පමණක් නොව ඇතැම් ක්ෂේත්‍රවල රජය අධ්‍යාපනයට මැදිහත් වී ඇත්තේ ද පසුව ය. රාජ්‍ය ඒකාධිකාරය නොමැතිව නිදහස් අධ්‍යාපනය පූර්ණ ව (ක්ෂේත්‍රයෙහි සියල්ලන්ට ම යන අර්ථයෙන්) ක්‍රියාත්මක නො වෙයි. බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයෙහි ද ඉගැන්වීම සඳහා පෞද්ගලික ආයතන ඇතිකළහොත් පූර්ණ නිදහස් අධ්‍යාපනය නැති වී රැකියා සඳහා යම්කිසි අයුරකින් තරගයක් ඇතිවෙයි. නැතහොත් ඇතැම්විට රැකියා නොමැති වෛද්‍යවරුන් බිහිවිය හැකි ය. එවිට වෛද්‍යවරුන්ගේ තත්වය ද නැතිවී යයි. අද අවශ්‍ය වී ඇත්තේ වෛද්‍යවරුන්ට රැකියා සහිතව වෛද්‍ය වෘත්තියේ වැදගත්කම රැකගැනීම ය.

බටහිර නොවන වෙදකමට එවැනි ප්‍රශ්න නැත. එහෙත් ආයුර්වේදය මුල දී ඉන්දියාවේ දී හා පසුව ලංකාවේ දී ඉගෙනගත් අය ඉන්දීය චින්තනය වැළඳගැනීමට උත්සාහ කළා පමණක් නොව පාරම්පරික වෛද්‍යවරයාට ලියාපදිංචියේ දී හා වෙනත් අවස්ථාවල දී කෙණෙහිලිකම් කිරීමට ද පියවර ගත්හ. ඒ අතර ඔවුහු බොහෝ දෙනෙක් ක්‍රමයෙන් වෙදමහතා යන්න වෙනුවට ඩොක්ටර් යන්න යොදාගැනීමට පියවර ගත්හ. එක් පැත්තකින් ඉන්දියාවට දීන වන අතර අනෙක් පැත්තෙන් ආයුර්වේදය ද (බටහිර) විද්‍යාත්මක නොවේ යැයි කියන්නන් ඉදිරියේ දීන වීමට බොහෝ ආයුර්වේද වෛද්‍යවරුන්ට සිදුවිය.

සංගීතයෙහි ද එවැන්නක් දැකගත හැකි ය. ආයුර්වේද වෛද්‍යවරුන්ට මෙන් ම උත්තර භාරතීය සංගීතය හැදෑරුවනට ද තිබූ එක් ප්‍රශ්නයක් වූයේ ඒ ඒ ක්ෂේත්‍රවල අපේ යැයි කිවහැකි ඊනියා විද්‍යාවක්, ශාස්ත්‍රයක්, ප්‍රවාද ආදිය නොමැතිවීම ය. එක් පැත්තකින් මෙයට එක් හේතුවක් වන්නට ඇත්තේ ලන්දේසීන් හා අනෙක් යුරෝපීය

© Prof. Nalin De Silva

යටත්විජිතවාදීන් අදාළ පොතපත විනාශකිරීම ය. අනෙක් පැත්තෙන් පැරණි භාරතයේ තරමටවත් මෙරට වියුක්ත ප්‍රවාද නො තිබීම ය. සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතිය වියුක්ත ප්‍රවාද නිර්මාණයට තෝතැන්නක් නො වෙයි. වෛදික ආගම්වල මෙන් නොව බුද්ධදහමෙහි වියුක්ත ප්‍රවාද නොමැත.

එහෙත් අවාසනාවකට මෙරට බොහෝ උගතුනට මේ පිළිබඳ අවබෝධයක් නො තිබුණි. ඉන්දියාවට ඉගෙනීම සඳහා ගිය බොහෝ දෙනා ද බටහිර රටවලට එසේ ගිය බොහෝ දෙනාගෙන් වෙනස් නො වූහ. බටහිරට ගිය බොහෝ අය මෙන් ම ඔවුන් ද ලංකාවට ආපසු පැමිණියේ මෙරට ඊනියා ශාස්ත්‍රීය දරිද්‍රතාව ගැන ඇතිකරගත් උපකල්පන සහිතව ය. බටහිරට ගොස් ඉගෙනගත් අයට අවශ්‍ය වූයේ ලංකාවේ බටහිර ශාස්ත්‍රිය සම්ප්‍රදායක් ගොඩනැගීම ය. ඔවුන්ට ඊනියා විද්‍යාත්මක ආකල්ප විය. බටහිරට අධ්‍යාපනය සඳහා නොගිය එහෙත් ලංකාවේ දී උසස් අධ්‍යාපන ආයතනවලින් හෝ පොත්පත් කියවීමෙන් හෝ බටහිර අධ්‍යාපනයක් ලැබූ බොහෝ අයට ද අවශ්‍ය වූයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ශාස්ත්‍රීය (විද්‍යාත්මක) සම්ප්‍රදායක් මෙරට ඇතිකිරීම ය. බටහිර විද්‍යාවෙහි පමණක් නොව නවකතාවේ ද බෞද්ධ දර්ශනයෙහි ද අපට මේ තත්වය දැකගත හැකි ය.

ඉන්දියාවට ගොස් අධ්‍යාපනය ලැබූ බොහෝ අයට අවශ්‍ය වූයේ ඉන්දියාවේ මෙන් ශාස්ත්‍රීය සම්ප්‍රදායක් මෙරට බිහි කිරීම ය. මෙරට උත්තර භාරතීය සංගීත සම්ප්‍රදායක් හෝ ආයුර්වේද සම්ප්‍රදායක් හෝ බිහි කිරීම ඔවුන්ගේ අභිප්‍රාය විය. මේ අතර තවත් පිරිසක් ඉංගිරිසි, ප්‍රංශ, සංස්කෘත පොත් කියවීමෙන් ථෙරවාදයට වඩා මහායානය උසස් ලෙස සැලකීමට යොමුවූහ. ඔවුන්ට අනුව ගැඹුරු බෞද්ධ දර්ශනය තිබියේ මහායානයෙහි ය. ථෙරවාදයෙහි ගැඹුරක් නොදකින තත්වයකට ඔවුහු පත්වූහ. මේ සියල්ලම අපට සකස් කර දුන් කුඩා රටක විසුවන්ගේ කුඩා මනස්වල ප්‍රතිඵල විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva